රත්නපුර ප්‍රාදේශීය සභාව

රත්නපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන.

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූනි 03 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 02 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 10 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට රත්නපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 21 ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමඟ ඉදිරිපත් කළයුතු මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු JCB යන්ත්‍රය සභාව මඟින් ඉටු කරනු ලබන සෘජු කර්මාන්ත වලට යෙදවීම වෙනුවෙන් ඇස්තමේන්තුගත ආදායම සමාලෝචිත වර්ෂයේදී රු. 6,118,300 ක් ලෙස තක්සේරු කර තිබුණද, එම වටිනාකම සභාවේ ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) සභාව සතු කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය, ලෙලන තලනය හා ටිපර් රථය සභාව මඟින් ඉටු කරනු ලබන සෘජු කර්මාන්ත වලට යෙදවීම වෙනුවෙන් ඇස්තමේන්තුගත ආදායම සමාලෝචිත වර්ෂයේදී තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. තවද, උක්ත වාහන හා යන්ත්‍ර උපයෝජනය සම්බන්ධව විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

(ඇ) සභාව මඟින් කර්මාන්ත ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ ආයතන වෙතින් ලද රු. 51,780,895 ක් හා එමඟින් කරනු ලැබූ වියදම් සහා අරමුදලින් බැහැරව ගිණුම්ගත කර තිබූ බැවින් එම කර්මාන්ත සම්බන්ධයෙන් තොරතුරු මූල්‍ය ප්‍රකාශන මඟින් නිරීක්ෂණය නොවීය.

(ඈ) ප්‍රාදේශීය සභා පොදු සැපයුම් මිලදී ගැනීම් හා නිකුත් කිරීම් පොදු ගබඩා ගිණුම හරහා ගිණුම්ගත කර නොමැති අතර, වැයශීර්ෂය හරහා ගිණුම්ගත කර තිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව මුදල් ගිණුමේ ශේෂය රු. 9,334,052 ක්වූ අතර, බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය රු. 9,103,546 ක් වූයෙන් වෙනස රු. 230,506 ක් විය.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

-----------------------------

ගිණුම් විෂයයන් 08 කට අදාලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ සහ උපයෝගී ලේඛණ අනුව ශේෂයන්ගේ වෙනස රු. 4,747,553 ක් විය.

1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | | අනුකූල නොවීම්. |
|---|---|---|
| | ------------------------------------------ | ------------------- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| (I) | 132(ඒ) වගන්තිය | ප්‍රජා පිළිගැනීම හෝ පොදු වැදගත් කටයුත්තක් හෝ සිද්ධියක් හෝ අවස්ථාවක් පිළිබඳව හෝ වියදම් සඳහා එක් වර්ෂයකට රු. 1,000 ඉක්මවන වියදම් සඳහා අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත්, ඊට පටහැනිව අවස්ථා 04 කදී එකතුව රු. 308,647 ක වියදම් දරා තිබුණි. |
| (II) | 132(ඔ) වගන්තිය | පුණ්‍ය හෝ සුභසාධන අංශ වලට ආධාර පිණිස එක් වර්ෂයකට මුළු එකතුව රු. 1,000 ඉක්මවන වියදම් සඳහා අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, ඒ පිළිබඳව නොසලකා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය රහිතව වර්ෂය තුලදී ආගමික ස්ථාන සංවර්ධන කටයුතු සඳහා අවස්ථා 04 කට අදාලව රු. 363,379 ක වියදම් සහා අරමුදලින් දරා තිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 177 | 2013 අප්‍රේල් 30 දිනැති සභා තීරණය අනුව සමාලෝචිත වර්ෂය තුලදී මිළ ගණන් කැඳවීමකින් තොරව පෞද්ගලික ආයතනයක් වෙතින් රු. 208,919 ක් වටිනා පුස්තකාල පොත් මිලදී ගෙන තිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
|---|---|
| මුදල් රෙගුලාසි අංක 371 | 2005 වර්ෂයේ සිට ඉදිරියට එනු ලබන රු. 432,639 ක අත්තිකාරම් මුදල විගණිත දිනය වූ 2015 ජූලි 20 දින වනවිටත් පියවීමට කටයුතු කර නොතිබුණි. |

(ඈ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

| | |
|---|---|
| 2.8.4 හා 8.12.3 | සමාලෝචිත වර්ෂය තුල සභාව විසින් මිලදී ගෙන තිබූ රු. 236,874 ක්වූ භාණ්ඩ නියමිත පිරිවිතරයන්ගෙන් හා වෙනත් එකඟවූ නියමයන්ට අදාලද යන්න පරීක්ෂා කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් ඇගයීමට ලක්කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 18,820,702 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,916,769 ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
-------------------------------------

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු. 14,903,933 කින් වැඩිවී තිබූ අතර, එය සියයට 380 ක වැඩිවීමක් බව නිරීක්ෂණය විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්ථන වියදම් වැඩිවන වේගයට වඩා වැඩි වේගයකින් මෙහෙයුම් අයභාරය වැඩිවීමකි.

2.3 ආදායම් පරිපාලනය
----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්
----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 211 | 47 | 72 |
| බදු කුලී | 1,300 | 162 | - |
| බලපත්‍ර ගාස්තු | 705 | 544 | 204 |
| වෙනත් ආදායම් | 19,473 | 29,743 | 18,329 |

2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම් හා රැස්කල ආදායම සමඟ සැසඳීමේදී සේවා සඳහා ගාස්තු හා වෙනත් ආදායම් වල ඇස්තමේන්තුගත ආදායමට වඩා රැස්කල අදායමෙහි පිළිවෙලින් සියයට 15 ක් සියයට 66 වැඩිවීමක්ද, වරිපනම් හා බදු, බදු කුලී ආදායම්, බලපත්‍ර ගාස්තු සහ වරෙන්තු හා දඩ වල ඇස්තමේන්තුගත ආදායමට වඩා රැස්කල අදායමෙහි පිළිවෙලින් සියයට 78, සියයට 88, සියයට 22 හා සියයට 3 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

2.3.3 අක්කර බදු

2014 දෙසැම්බර් 31 දිනට රු. 27,000 ක හිඟ අක්කර බදු ශේෂයක් පැවති අතර, එකී ශේෂයන් 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාල පරාසයක් විය.

2.3.4 වෙනත් ආදායම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ 2009 අප්‍රේල් 17 වන දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ V වන උපලේඛණය ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුල පවතින දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සම්බන්ධයෙන් නිසි සමීක්ෂණයක් සිදුකර නියමිත ගාස්තු අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ) ත්‍රීරෝද රථ සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් පනවා ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත්කර ආදායම් උත්පාදනය කර ගැනීම සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශිත දැන්වීම් පුවරු පිළිබඳ ප්‍රමාණවත් සමීක්ෂණයක් සිදුකර විධිමත් පරිදි අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උත්පාදනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභා බල ප්‍රදේශය තුල ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදුකල යුතු වුවද, ප්‍රමාණවත් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. 2013 නොවැම්බර් 29 දිනැති අංක 1839 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනය අනුව ව්‍යාපාර බලපත්‍ර හා කර්මාන්ත බදු යටතේ 2014 වර්ෂය වෙනුවෙන් පනවා ඇති බදු 2014 අප්‍රේල් මස 01 දිනට පෙර සභාවට අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඉ) බැක්හෝ ලෝඩරය, ලෙලන තලනය හා කොන්ක්‍රීට් මිශ්‍රණය යනාදී යන්ත්‍ර උපකරණ ප්‍රාදේශීය සභාවට ආදායම් රැස්කල හැකි මාර්ග වුවත්, ආදායම් රැස්කල බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

(අ) 2014 සැප්තැම්බර් සිට දෙසැම්බර් මාසය දක්වා අදාල උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු උපලේඛණ මඟින් හඳුනාගෙන සභාවට අයකර ගැනීමට විගණිත දිනය වූ 2015 ජූලි 20 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ආ) උසාවි දඩ බිල්කල ආදායම ලෙස රු. 9,500,000 ක් ගිණුම්ගත කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයට අදාලව කිසිදු ආදායමක් ලැබී නොතිබුණි. තවද, 2013 වර්ෂයට අදාලව නොවැම්බර් හා දෙසැම්බර් දක්වාද උසාවි දඩ ආදායම් ලැබී නොතිබුණි. එහෙත් උසාවි දඩ හිඟ ආදායම් ලෙස රු. 9,288,584 ක් එනම්, බිල්කල ආදායමටත් වඩා අඩු ආදායමක් දක්වා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ එකක් රු. 1,950 බැගින් වූ සෙවිලි තහඩු 80 ක් රු. 156,000 කට මිලදී ගෙන තිබූ අතර, නිකුත් කිරීමේ නියෝග අංක 113 මගින් තහඩු 25 ක් නිකුත් කර තිබුණද, ඒවා භාරගත් බවට නිසි පුද්ගලයෙකුගෙන් අත්සන් ලබා නොතිබුණි. තවද, විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 ජූලි 20 දින වනවිටත් භෞතිකව තහඩු කිසිවක් සභා පරිශ්‍රයේ නොතිබුණි.

(ආ) සභා සීමාව තුල පිහිටි සුසාන භූමි අතරින් සුසාන භූමි 54 ක් පමණක් හඳුනාගෙන තිබුණද, එකී සුසාන භූමි අතරින් අක්කර 31 කට අධික සුසාන භූමි 53 ක් සම්බන්ධයෙන් මැනුම් කටයුතු සිදුකර සභාව වෙත විධිමත් ලෙස පවරා ගෙන ලේඛණගත කිරීමට කටයුතු කර නොතිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු

----------------------

(අ) 2014 ජූලි 31 දිනැති මහා සභා රැස්වීමේදී සභා තීරණ අංක 04.05 යටතේ එක් සභිකයෙකුට රු. 50,000 බැගින් මන්ත්‍රී යෝජනා සඳහා ප්‍රතිපාදන ලබා දීමට තීරණය කර තිබූ අතර, රු. 982,450 ක් වටිනා ද්‍රව්‍ය ආධාර ලබාගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

i. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඔ) වගන්තියේ විධිවිධාන වලට පටහැනිව සුභසාධන කටයුතු සම්බන්ධයෙන් ඉහත සඳහන් ගෙවීම් සභා අරමුදලින් වැය දරා තිබූ බව නිරීක්ෂණය විය.

ii. මෙම ප්‍රතිපාදන යටතේ ද්‍රව්‍ය ආධාර ලබා දීමේදී ප්‍රතිලාභීන් තෝරා ගැනීම පිළිබඳව විධිමත් වැඩපිළිවෙලක් හඳුනාගෙන නොතිබුණි.

iii. එකී සුභසාධන භාණ්ඩ බෙදාහැරීමෙන් පසු අදාල කාර්යය වෙනුවෙන් එකී භාණ්ඩ යොදාගත් බවට නිසි පසුවිපරමක් සභාව විසින් සිදුකර නොතිබුණි.

iv. රු. 35,000 ක බට මිලදී ගැනීම්, තොග පොතේ ඇතුලත් කර නොතිබූ අතර, ද්‍රව්‍ය නිකුත් කිරීමේ නියෝගයද නොතිබුණි. භෞතිකවද සභාව තුල නොතිබූ බැවින් එකී භාණ්ඩ මිලදී ගැනීම් හා බෙදාහැරීම් පිළිබඳව විගණනයේදී මතබේදයට තුඩුදෙන්නක් විය.

(ආ) මෙම මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ 2014 හා 2015 වර්ෂය තුලදි එකක් රු. 830 බැගින් වූ ප්ලාස්ටික් පුටු 775 ක් රු.643,250 කට මිලදී ගෙන තිබූ අතර, පුටු 556 ක් බෙදාහැර තිබුණි.

(i) විගණිත දිනය වනවිටත් භෞතිකව සභා පරිශ්‍රයේ කිසිඳු ප්ලාස්ටික් පුටු ප්‍රමාණයක් නොතිබුණි. තවද, නිකුත් කිරීමේ නියෝග අංක 116 මගින් ප්ලාස්ටික් පුටු 60 ක් නිකුත් කල බවට දක්වා ඇතත්, ප්ලාස්ටික පුටු භාරගත් බවට නිසි පුද්ගලයෙකු අත්සන් තබා නොතිබූ අතර, රු. 231,570 ක් වටිනා ප්ලාස්ටික් පුටු 279 ක් සම්බන්ධයෙන් විගණනයේදී ගැටළුසහගත තත්ත්වයක් මතුවිය.

(ii) ඉහත මිලදී ගැනීම් සම්බන්ධයෙන් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 සහ 8.12.3 ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර ඒ සම්බන්ධයෙන් තාක්ෂණික දැනුමක් ඇති පුද්ගලයෙකු විසින් අදාල නිර්දේශ ලබාදිය යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි.

3.3 විදේශ ගමන් වියදම්

---------------------------

පෞද්ගලික ආයතන විසින් සංවිධානය කරන ලද විදේශ සංචාර 4 කට සභිකයින් හා නිලධාරියෙකු සහභාගී වී තිබූ අතර සංචාරය සඳහා රු. 1,773,472 ක මුදලක් සභා අරමුදලින් වැය දරා තිබුණි.

ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විදේශ ගතවීමට පෙර නිවාඩු අනුමත කරවාගත යුතු වුවත්,උක්ත විදේශ සංචාර 4 සඳහා සහභාගී වූවන් විදේශ ගත වීමට පෙර ගරු ආණ්ඩුකාවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ii) ඉන්දියානු සංචාරයට හා වියට්නාම සංචාරයට අදාල ගෙවීම් සම්බන්ධයෙන් බිල්පත් කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) විදේශ පුහුණුව මගින් ලබාගත් දැනුම දේශීය වශයෙන් උපයෝගී කර ගන්නා ආකාරය පිළිබඳව වාර්තාවක් පුහුණුව අවසන් වී මාසයක් ඇතුලත ලබාදිය යුතු වුවත්, II හි සඳහන් සංචාර දෙකේදී විදේශ සංචාර අවසන් කර මෙම වාර්තාවේ දිනය දක්වාම එවැනි ලියවිල්ලක් ඉදිරිපත් කර නොතිබුණි.

(iv) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ අංක PL/07/01/05/26 හා2010 සැප්තැම්බර් 09 දිනැති ලිපිය අනුව පළාත් පාලන ආයතන ප්‍රධානියෙකු හෝ නියෝජ්‍ය ප්‍රධානියෙකු හෝ සභිකයෙකු විදේශ පුහුණු වැඩසටහන් සඳහා තෝරා ගන්නේ නම් අදාල සංවිධානය හෝ විදේශ රාජ්‍ය හෝ විදේශ ආයතනයක් ඒ සඳහා වැයවන සියළු වියදම් හා පහසුකම් දැරිය යුතු වුවත්, එම චක්‍රලේඛ විධිවිධාන නොසලකා ඉහත ගෙවීම් සිදු කර තිබුණි.

3.4 <u>තාර බැරල් මිලදී ගැනීම</u>

i. සමාලෝචිත වර්ෂය තුල එකක් රු. 16,560 බැගින් වූ රු. 397,440 ක් වටිනා ලීටර් 180 තාර බැරල් 24 ක් මිලදී ගෙන 2014 අගෝස්තු 25 දින රු. 411,750 ක් ගෙවීම නිසා රු. 14,310 ක මුදලක් වැඩිපුර ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවා තිබුණි. විගණිත දිනය වූ 2015 ජූලි 20 දින වනවිටත් වැඩිපුර ගෙවූ මුදල් සභාවට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ii. විගණිත දිනය වූ 2015.07.23 දින වනවිට තොග පොත අනුව තාර බැරල් 39 ක ශේෂයක් පැවති අතර, කර්මාන්ත 06 ක් වෙනුවෙන් නිකුත් කල තාර බැරල් 25 ක ශේෂයක් තොග පොතින් අඩුකර නොතිබූ අතර, එසේ නිකුත් කල තාර බැරල් වෙනුවෙන් ද්‍රව්‍ය නිකුත් කිරීමේ නියෝග නිකුත් කර නොතිබුණි. තවදුරටත් තාර බැරල් 14 ක් සභාවේ භෞතිකව පැවතිය යුතු නමුත් භෞතික පරීක්ෂාවේදී තාර බැරල් 02 ක් පමණක් පවතින බව නිරීක්ෂණය විය.

3.5 <u>වීථි පහන් හා උපකරණ මිලදී ගැනීම</u>

වීථි පහන් මිලදී ගැනීම හා සවිකිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී රු. 225,000 ක් වැය දරා තිබුණි. පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි පහන් සවිකිරීම පිළිබඳව විධිමත් වැඩපිළිවෙලක් නොතිබුණි.

(ii) විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය මඟින් වීථි ආලෝකකරණය සම්බන්ධයෙන් වන උපදෙස් පිළිබඳව සලකා බැලීමකින් තොරව වීථි ආලෝකකරණය ක්‍රියාත්මක වන අතර, වීථි පහන් සවිකිරීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය සමඟ ඇති කරගත් එකඟතාවයද විගණනයට ඉදිරිපත් නොවුණි.

(iii) වීථි පහන් මිලදී ගැනීම් සම්බන්ධයෙන් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 හා 8.12.3 ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවක් නොවූ අතර, අදාල පිරිවිතරයන්ට අනුකූලව මිලදී ගත් බවට තාක්ෂණික නිළධාරියෙකුගේ සහතික කිරීමද නොතිබුණි.

3.6 නිශ්ක්‍රීය වත්කම්

---------------------

(අ) ලියාපදිංචි අංක 68 - 4960 දරන ලොරි රථය සම්බන්ධයෙන් අවසන් වරට 2012 නොවැම්බර් 20 දින රු. 413,679 ක අළුත්වැඩියාවක් සිදුකර තිබුණද, එකී අළුත්වැඩියාවෙන් පසු විගණිත දිනය වූ 2015 ජූලි 20 දින වනවිටත් ධාවන තත්ත්වයේ නොමැතිව අක්‍රීය තත්ත්වයෙන් පවතින අතර, ඒ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) යුධ හමුදාවට ලබා දී තිබූ කැබ් රථය නැවත සභාවට ලැබී තිබූ අතර, වර්ෂයක පමණ කාලයක් ගතවී තිබුණද, එකී රථය ධාවන තත්ත්වයේ නොමැතිව සභාවේ ගාල් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් විගණිත දිනය වූ 2015 ජූලි 20 දින වනවිටත් ගෙන නොතිබුණි.

4. පද්ධති හා පාලන

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය